සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගම - 2019
-----------------------------------------------------------------

**1.1** මතය
-----

සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුයැයි අදහස් කරනු ලබන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
---------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4** විගණන විෂය පථය
-------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ

වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් පිරිමැසුම්දායීව, කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දින වන විට සමාගමේ ජංගම ගිණුමේ ධනාත්මක ශේෂය රු. 11,794,411 කි. කෙසේ වෙතත්, එවැනි අරමුදල් කෙටි කාලීන කාලයක් සඳහා පොලී උපයන ප්‍රභවයන්හි ආයෝජනය කිරීමට කළමනාකාරිත්වය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත. | අප සතුව අතිරික්ත අරමුදල් ඇති විට ඒවා ස්ථාවර තැන්පතු ගිණුමකට මාරු කිරීම හෝ මහජන බැංකුව සමඟ නැවත මිලදී ගැනීමේ ගිවිසුම්හි (REPO) ආයෝජනය කරනු ලැබේ. 2020 ජනවාරි 03 වන දින අපි තවත් අරමුදල් ලැබීමෙන් පසු රු.35,000,000.00 ක් දින 10 ක් සඳහා REPO හි ආයෝජනය කර ඇත. | අතිරික්ත මුදල් ඵලදායී ලෙස ආයෝජනය කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.71,966,012 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ අලාභය රු.40,009,623 ක් වූයෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.111,975,635 ක වැඩිදියුණු වීමක් නිරීක්ෂණය විය. මීටර් අලෙවියෙන් ලැබෙන ආදායම රු.367,342,546 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වැඩිදියුණුවට ප්‍රධාන හේතුව විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධන ආදායම් හා වියදම් අයිතමයන් පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ පහත පරිදි වේ.

| ආදායම්/ වියදම් | 2019 | 2018 | වැඩිවිම/ අඩුවීම | ප්‍රතිශතය % |
|---|---|---|---|---|
| ආදායම | 1,250,543,858 | 883,201,312 | 367,342,546 | 41.59 |
| විකුණුම් පිරිවැය | 1,137,339,207 | 890,783,351 | 246,555,856 | 27.68 |
| පරිපාලන පිරිවැය | 23,023,217 | 34,640,526 | (11,617,309) | 33.54 |

සමාලෝචිත වර්ෂය හා පසු ගිය වර්ෂය සමඟ සැසඳීමේදි ආදායම රු.367,342,546 කින් වැඩි වී ඇති අතර විකුණුම් පිරිවැය ද රු.246,555,856 කින් වැඩි වී තිබුණි. තවද, පසු ගිය වර්ෂයේදි නව ස්මාර්ට්

මීටරයේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා රු.10,394,730 වියදමක් දැරීම හේතුවෙන් පරිපාලන පිරිවැය පෙර වර්ෂයට සාපේක්ෂව රු.11,617,309 කින් අඩු වී ඇත.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2019 | 2018 |
|---|---|---|
| දළ ලාභ අනුපාතය (ප්‍රතිශතය) | 9.05 | -0.86 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1:1.73 | 1:1.65 |

ප්‍රධාන වශයෙන් රු. 367,342,546 කින් මීටර් අලෙවිය වැඩි වීම හේතුවෙන් දළ ලාභ අනුපාතය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 9.91 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුල බණ්ඩරගම පිහිටි පරිශ්‍රයේ සිය ව්‍යාපාරය කරගෙන යාම සඳහා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම සමඟ විධිමත් කුලී ගිවිසුමක් නොමැත. කෙසේ වෙතත්, දේපල පරිහරණය සම්බන්ධයෙන් කිසිදු නෛතික හිමිකමක් නොතිබුණද, සමාගම එම පරිශ්‍රය තුළ සිය මෙහෙයුම් සම්පූර්ණයෙන් ස්ථාපිත කර ඇත. | ඇන්ටි ලෙකෝ මීටරින් සමාගම සහ සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම 2020 අගෝස්තු 25 වන දින විධිමත් ගිවිසුමකට එළඹුණි. | ප්‍රමාදයකින් තොරව කුලී ගිවිසුමකට එළඹීමට පියවර ගත යුතුය. |
| (ආ) | භාවිතයේ ඇති වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය කළමනාකරණය විසින් නිසි ලෙස තක්සේරු කර නොමැත. එම නිසා, 2019 දෙසැම්බර් 31 දින වන විට සමාගම විසින් තවදුරටත් භාවිතයේ පවතින රු.60,439,266 ක් වටිනා වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇත. | 2021 කාලය තුළ භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් නැවත ඇගයීමට පියවර ගනු ලැබේ. | ප්‍රමාදයකින් තොරව සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති වත්කම් නැවත තක්සේරු කිරීමට සහ ඒ අනුව ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | 2020 වර්ෂයේ සිට සෑම අර්ධ වර්ෂයක් සඳහාම ප්‍රසම්පාදන සැලසුම් සකස් කරන ලදී. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම සඳහා පියවර ගත යුතුය. |

3.3 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී/12 අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් (SORP) සමාගම සතුව නොතිබුණි. | බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියක් (SORP) සැලසුම් කිරීම සඳහා සමාගම යවා ඇති අතර මෙම සැලැස්ම 2021 වර්ෂය ආරම්භයේදී සම්පූර්ණ කරනු ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන සමඟ අනුකූල විය යුතුය. |
| (ආ) | සමාගම සතුව පුළුල් පාලන හා පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොතක් නොමැත. | පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොත 2021 වර්ෂය තුළ ලබා දෙනු ඇත. | පරිපාලන ක්‍රියා පටිපාටි අත්පොත සකස් කිරීමට සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගත යුතුය. |

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී/12 මගින් නිරූපණය කර ඇති පරිදි සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | සමාගම 2021 වර්ෂයේ සිට වසර 05 ක් සඳහා සංයුක්ත සැලැස්මක් මෙන්ම වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ද සකස් කර තිබේ. | චක්‍රලේඛයේ විධිවිධාන සමඟ අනුකූල විය යුතුය. |

4.2 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය අනුව, සමාගම විසින් වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් ලබා දී නොමැත. | චක්‍රලේඛයේ විධිවිධාන සමඟ අනුකූල විය යුතුය. |

**4.3** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි. | සමාගම 2020 වර්ෂයේදී අභ්‍යන්තර විගණන කාර්යය බාහිරින් ලබාගෙන ඇති අතර වාර්ෂික විගණන සැලැස්ම මත පදනම්ව මෙම කාර්යය දැනට සිදු කරනු ලැබේ. | අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |

**4.4** විගණන කමිටුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය අනුව සමාගම විසින් විගණන කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි, | විගණන කමිටුව 2021 වර්ෂය තුළ පිහිටුවනු ඇත | චක්‍රලේඛයේ විධිවිධාන සමඟ අනුකූල විය යුතුය. |

**4.5** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය ප්‍රකාරව, වාර්ෂික අයවැය ලේඛනය තුල අයවැයගත ආදායම් හා වියදම් ලේඛනය, වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වර්ෂය අවසානයේදී ශේෂ පත්‍රය සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග අයවැයගත මූලධන වියදම් පිළිබඳ ප්‍රකාශනය අන්තර්ගත විය යුතුයි. කෙසේවුවද, සමාගම විසින් එම අවශ්‍යතා ඉටු කර නොමැත. | 2020 වර්ෂය සඳහා සමාගම විසින් ප්‍රාග්ධන වියදම් ප්‍රකාශය, අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශ සහ අයවැයගත මුදල් ප්‍රවාහයන් සකස් කර ඇති අතර ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. | චක්‍රලේඛයේ විධිවිධාන සමඟ අනුකූල විය යුතුය. |

**4.6** තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව, සියලුම රාජ්‍ය ආයතන තම විෂය පථය යටතට ගැනෙන අරමුණු සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා දායක විය යුතුයි. කෙසේවෙතත්, සමාගම, තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත් වී නොතිබුණ අතර සපුරාගත යුතු ඉලක්ක, එම අරමුණු සපුරා ගැනීමේදී ඇතිවන අඩුපාඩු සහ එහි ප්‍රගතිය මැන බැලීම සඳහා වන සුදුසු දර්ශකයන් ද හඳුනා ගෙන නොතිබුණි. | සුදුසු තිරසාර සංවර්ධන ඉලක්ක ඇන්ටි ලෙකෝ මිටරින් සමාගම සඳහා හඳුනාගෙන 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කෙරේ. | සමාගම තිරසාර සංවර්ධන ඉලක්ක පිළිබඳ එක්සත් ජාතීන්ගේ “2030 න්‍යාය පත්‍රයට” අනුකූල විය යුතුය. |